## 6. ශීර්ෂය 06 - රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය

-----------------------------------------------------

### 6.1 විගණන විෂය පථය

---------------------

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජනවාරි 09 දින කොමිෂන් සභාවේ ලේකම්වරිය වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් පදනම්වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 6.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

-------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 6.3 විගණන නිරීක්ෂණය

---------------------

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සහ (ආ) හි වූ පොදු නිරීක්ෂණ සහ පහත 6.4 සහ 6.5 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

---------------------

වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.2,452,617 ක් වූ අතර, එය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 35.6 ත් සියයට 69.4 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

----------------------------------------------------------------------

විෂය අංක 00601 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, 2001 ජුලි 01 දින සේවය අතහැර ගිය නිලධාරියෙකුගේ රු.32,320 ක් වූ ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනිමට නොහැකි වි තිබුණි.

## 6.4 යහ පාලනය හා ගිණුම්කටයුතුභාවය

------------------------------------------

### 6.4.1 සංයුක්ත සැලැස්ම

--------------------

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව, 2013 දෙසැම්බර් 31 දින වන විටත් කොමිෂන් සභාවේ කාර්යාලයට අදාල සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 6.4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

-------------------------------

ඉහත 6.4.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

## 6.5 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 44 | 34 | 10 |
| (ආ) | තෘතියික මට්ටම | 05 | 04 | 01 |
| (ඇ) | ද්විතියික මට්ටම | 98 | 83 | 15 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 48 | 33 | 15 |
| | එකතුව | 195 | 154 | 41 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 41 ක් පිරවීමට කාර්යාලය අපොහොසත් වී තිබුණි.